070310

OL/2024(2025)/61/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**61 | S | I, II**

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |

| | |
|---|---|
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| EMF | |

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

**භූගෝල විද්‍යාව I, II**
புவியியல் I, II
Geography I, II

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## භූගෝල විද්‍යාව I

විභාග අංකය: ........................

***උපදෙස්:***
- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** ප්‍රධාන වශයෙන් ........................ සමග උෂ්ණත්වය වෙනස්වීමේ ස්වභාවය පදනම් කරගෙන වායුගෝලය ස්තර හතරකට බෙදා දැක්වේ.
(උන්නතාංශය / පීඩනය / ආර්ද්‍රතාව)

**2.** විවිධ පාෂාණ ද්‍රව්‍ය අධික තාපයට හා පීඩනයට හසුවීම නිසා ඒවායේ මුල් ස්වභාවය වෙනස්වීමෙන් ...................................... පාෂාණ නිර්මාණය වේ.
(ආග්නේය / අවසාදිත / විපරීත)

**3.** ශ්‍රී ලංකාවේ සිලිකා වැලි ඛනිජය බහුලව ව්‍යාප්ත වී ඇත්තේ ................................... ප්‍රදේශයෙහි ය.
(මාරවිල / පුල්මුඩේ / බලංගොඩ)

**4.** කළුතර, කෑගල්ල හා ............................. යන දිස්ත්‍රික්කවල ප්‍රධාන ව්‍යාපාරික බෝග වගාව වන්නේ රබර් ය.
(රත්නපුර / කුරුණෑගල / බදුල්ල)

**5.** ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවෙහි වැඩි ම ප්‍රතිශතයක් හිමිවන්නේ ......................................... ජනතාවට ය.
(ග්‍රාමීය / නාගරික / වතු)

- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් '**නි**' යන්න වටා ද වැරදි නම් '**වැ**' යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** 'හවායි' දූපත් නිර්මාණය වී ඇත්තේ යමහල් ක්‍රියාකාරිත්වයෙහි ප්‍රතිඵලයක් වශයෙනි. **නි / වැ**

**7.** 'සහරා' 'අරාබි' සහ 'ථාර්' යන කාන්තාර ප්‍රදේශ නිවර්තන දේශගුණ කලාපය තුළ පිහිටා ඇත. **නි / වැ**

**8.** මාතර, ගාල්ල සහ කළුතර යන දිස්ත්‍රික්කවල ව්‍යාප්තව ඇති තේ වගාව 'මැදරට' තේ වගාව ලෙස හැඳින්වේ. **නි / වැ**

**9.** ශ්‍රී ලංකාවේ කිරි ලබා ගැනීම සඳහා ඇතිකරනු ලබන මී ගවයන්ගෙන් 2/3 ක් ම ඇති කරනු ලබන්නේ වියළි කලාපීය ප්‍රදේශවල ය. **නි / වැ**

**10.** බෙංගාල බොක්ක අවට ඉන්දියන් සාගරයේ හටගන්නා සුළි සුළං 'හරිකේන්' නමින් හඳුන්වනු ලැබේ. **නි / වැ**

- අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්, සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** පස තුළ අන්තර්ගතව ඇති ජලය ............................... ලෙස හැඳින්වේ.

**12.** ග්‍රැනයිට් පාෂාණවලින් සමන්විතවන මහාද්වීපික කබොල සිලිකා හා ඇළුමිනියම්වලින් යුක්තවන හෙයින් ............................ ස්තරය ලෙස හැඳින්වේ.

[දෙවැනි පිටුව බලන්න.

13. ඇළහැර හා ඔක්කම්පිටිය .................................. ඛනිජය සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.


14. ලෝකයේ මහාද්වීපවල ජන සංඛ්‍යාව ව්‍යාප්ත වී ඇති ආකාරය අනුව මුළු ජන සංඛ්‍යාවෙන් 76% ක්ම වාසය කරන්නේ ආසියාව සහ .......................... යන මහාද්වීප දෙකෙහි ය.

15. ශ්‍රී ලංකාවේ ගෘහ කර්මාන්තවල ස්ථානගතවීම අනුව පිළිමතලාව ප්‍රදේශය වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ .......................... කර්මාන්තයට ය.

16. සියලුම වනාන්තර වර්ග අතුරින් ඉහළ ම ජෛව විවිධත්වයක් දක්නට ඇත්තේ .......................... වනාන්තරවල ය.

● අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කර ගන්න.

**ශ්‍රී ලංකාවේ කිරි ආශ්‍රිත වෙළඳපොළ ප්‍රවණතා 2005-2019**




17. ඉහත ප්‍රස්තාරය අනුව වාර්ෂික මුළු කිරි පරිභෝජනය උපරිම අගයක් ගන්නේ.......................වර්ෂයේ දී ය.

18. වාර්ෂික මුළු කිරි නිෂ්පාදන ප්‍රමාණය හා ආනයන අතර වැඩිම පරතරයක් දක්නට ඇත්තේ .......................... වර්ෂයේ දී ය.

19. මුළු කිරි පරිභෝජනයේ උච්චාවචනයන් කෙරෙහි වැඩි බලපෑමක් සිදුව ඇත්තේ නිෂ්පාදනය හා ආනයන අතුරෙන් කුමකින් ද? ..................................

● අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරු අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

20.

| 'අ' **බෝගය** | 'ආ' **පර්යේෂණායතනය පිහිටා ඇති ස්ථානය** |
|---|---|
| 1. වී | A - මාතලේ |
| 2. තේ | B - ලබුකැලේ |
| 3. සුළු අපනයන බෝග | C - බෝඹුවල |
| | D - තලවාකැලේ |

(1) A, B, C (2) B, C, D (3) C, D, A (4) D, C, A (......)

21.

| 'අ' **විදුලි බලාගාරය** | 'ආ' **විදුලි ප්‍රභවය** |
|---|---|
| 1. කැනියොන් | A - තාප විදුලිය |
| 2. නොරච්චෝලේ | B - සුළං බලය |
| 3. බරුතකන්ද | C - සූර්ය ශක්තිය |
| | D - ජල විදුලිය |

(1) A, B, C (2) B, C, D (3) C, B, D (4) D, A, C (......)

**22.**

| 'අ' සංචාරක ආකර්ෂණය | 'ආ' වැදගත් ස්ථාන |
|---|---|
| 1. දියමත ලිස්සායාම | A - ආරුගම්බේ |
| 2. සමුද්‍ර අභය භූමිය (කොරල්) | B - හික්කඩුව |
| 3. පුළුල් වැලිතලාවලට මායිම් වූ නොගැඹුරු මුහුද | C - පාසිකුඩා |
| | D - මන්නාරම |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) C, D, A (……)

**23.**

| 'අ' රට | 'ආ' මිලියන නගරය |
|---|---|
| 1. ඇමෙරිකා එක්සත් ජනපදය | A - සාඕ පොලෝ |
| 2. දකුණු කොරියාව | B - ලොස් ඇන්ජලීස් |
| 3. ආර්ජන්ටිනාව | C - සෝල් |
| | D - බුවනෝස් අයර්ස් |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, B, C (……)

**24.**

| 'අ' ගිනි කඳු | 'ආ' පිහිටි රට |
|---|---|
| 1. ක්‍රකටෝවා | A - ඉතාලිය |
| 2. හෙක්ලා | B - ඉන්දුනීසියාව |
| 3. පිනාටුබෝ | C - අයිස්ලන්තය |
| | D - පිලිපීන් දූපත් |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, B, C (……)

- අංක **25** සිට **37** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**25.** 'පැනමා' ඇළෙන් සම්බන්ධවන සාගර දෙක වන්නේ,
(1) අත්ලන්තික් සහ පැසිෆික් ය. (2) පැසිෆික් සහ ඉන්දියන් ය.
(3) ඉන්දියන් සහ අත්ලන්තික් ය. (4) පැසිෆික් සහ ආර්ක්ටික් ය. (……)

**26.** ප්‍රතිලෝම සම්බන්ධයක් ඇති වරණය තෝරන්න.
(1) ගෝලීය උණුසුම - හිම වැස්ම දියවීම (2) වනහරණය - කාන්තාරකරණය
(3) වර්ෂාපතනය - නායයෑම (4) උන්නතාංශය - උෂ්ණත්වය (……)

**27.** ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග හා සම්බන්ධ **නොගැලපෙන** පිළිතුර කුමක් ද?
(1) මල් වර්ග - නුවරඑළිය (2) කරාබු නැටි - මහනුවර
(3) කජු - මන්නාරම (4) ගම්මිරිස් - මොණරාගල (……)

**28.** වර්තමානයේ විශාල නෞකා බහුල වශයෙන් භාවිත වන්නේ කුමන කාර්යයක් සඳහා ද?
(1) භාණ්ඩ ප්‍රවාහනයට (2) මගී ප්‍රවාහනයට
(3) යුද කටයුතුවලට (4) ධීවර කටයුතුවලට (……)

**29.** ලෝහමය **නොවන** ඛනිජයකි,
(1) මැණික්. (2) ඉල්මනයිට්. (3) රූටයිල්. (4) මැග්නීසියම්. (……)

**30.** ශ්‍රී ලංකාවේ භූගත ජල ද්‍රෝණි බහුලව ව්‍යාප්තව ඇති දිස්ත්‍රික්ක යුගලය කුමක් ද?
(1) මන්නාරම හා මුලතිව් (2) අනුරාධපුර හා කුරුණෑගල
(3) පුත්තලම හා කිලිනොච්චි (4) ත්‍රිකුණාමලය හා වව්නියාව (……)

**31.** ලෝකයේ තිරිඟු නිෂ්පාදනය සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ගන්නා රටවල් දෙක ඇතුළත් වරණය තෝරන්න.
(1) චීනය හා කැනඩාව (2) ඉන්දියාව හා රුසියාව
(3) ඕස්ට්‍රේලියාව හා කැනඩාව (4) චීනය හා ඉන්දියාව (……)

**32.** කඳුකර වියළි කලාපීය වනාන්තර දක්නට ලැබෙන ප්‍රදේශයක් වන්නේ මින් කුමක් ද?
(1) කන්නෙලිය (2) සමනල කන්ද (3) සඳතැන්න (4) පිදුරුතලාගල (……)

**33.** මුහුදු මට්ටමේ සිට ඇති උස අනුව පෙළගැස්වූ විට නගරවල පිහිටීමේ නිවැරදි ආරෝහණ අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ත්‍රිකුණාමලය, මහනුවර, නුවරඑළිය, හැටන්
(2) ත්‍රිකුණාමලය, මහනුවර, හැටන්, නුවරඑළිය
(3) මහනුවර, හැටන්, නුවරඑළිය, නාවලපිටිය
(4) මහනුවර, නුවරඑළිය, හැටන්, ගම්පොළ (......)

**34.** පහත ප්‍රකාශ සලකන්න.
A - පරිසර දූෂණය අවම වීම
B - මූලික පිරිවැය අවම වීම
C - ක්ෂය නොවන සම්පතක් වීම
D - දේශීය තාක්ෂණය භාවිත කළ හැකිවීම
ඉහත A සිට D දක්වා ඇති කරුණු අතුරෙන් ශ්‍රී ලංකාවේ සුළං බල ශක්ති හා සූර්ය බල ශක්ති උත්පාදනය හා භාවිතය සම්බන්ධ පොදු වාසිදායක කරුණු ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.
(1) A හා B (2) A හා C (3) A හා D (4) C හා D (......)

**35.** ලෝක ජන ව්‍යාප්තිය අනුව අධික ජන සංඛ්‍යාවක් වාසය කරන ගංගා නිම්නයක් වන්නේ,
(1) කොන්ගෝ ය. (2) මරේ ඩාලිං ය.
(3) ගංගානම් ය. (4) ඇමේසන් ය. (......)

**36.** භූ විද්‍යාත්මක උපද්‍රවයකට නිදසුනකි,
(1) සුනාමි. (2) සුළි සුළං.
(3) අකුණු සැර. (4) ලැව් ගිනි. (......)

**37.** ශ්‍රී ලංකාවේ ආපදා අනතුරු අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි වඩාත් ප්‍රතිඵලදායි ක්‍රියාමාර්ගය වන්නේ,
(1) ජනමාධ්‍ය මගින් නිරතුරුව දැනුම්වත් කිරීම ය.
(2) ආපදා අවම කර ගැනීමේ මෙවලම් හඳුන්වා දීම ය.
(3) ආපදාවලට ඔරොත්තු දිය හැකි නූතන ඉදිකිරීම් ක්‍රම හඳුන්වා දීම ය.
(4) පාසල් අධ්‍යාපනය තුළින් ආපදා ආරක්ෂණ වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම ය. (......)

● පහත **A, B, C** සහ **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A** - 1. වන සංරක්ෂණය
2. ජල පෝෂක ප්‍රදේශ

**B** - 1. කාර්මීකරණය
2. පාරිසරික සමතුලිතතාව

**C** - 1. සංවර්ධන ක්‍රියාවලිය
2. මානව සම්පත

**D** - 1. ප්‍රාග්ධන හිඟය
2. බහු ජාතික සමාගම්

**38.** පළමුවැන්නේ සාර්ථකත්වය දෙවැන්නේ පැවැත්මට හිතකර වන මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (......)

**39.** දෙවැන්නේ පැවැත්මට පළමුවැන්න බාධාවක් වන මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (......)

**40.** පළමුවැන්නේ සාර්ථකත්වයට දෙවැන්නේ දියුණුව බලපාන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (......)

* *

70285


සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 | II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

## භූගෝල විද්‍යාව II / புவியியல் II / Geography II




SCALE : 1 : 50,000

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**61 | S | I, II**

70289

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

**භූගෝල විද්‍යාව I, II**
புவியியல் I, II
Geography I, II

## භූගෝල විද්‍යාව II

- ✻ මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
- ✻ **I** කොටසේ **01** ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- ✻ **II** කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
- ✻ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

### I කොටස

**1.** (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 හූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක **8**) යොදා ගන්න.

- අංක (i) සිට (iv) තෙක් ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) Ⓐ අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?
(ඓතිහාසික ස්ථානය / ත්‍රිකෝණමිතික ස්ථානය / තානායම) (ලකුණු 01 යි)

(ii) Ⓑ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(වාරි ඇළ / අඩිපාර / රක්ෂිත මායිම) (ලකුණු 01 යි)

(iii) Ⓒ අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?
(ගල් තලාව / වනාන්තරය / ළඳු කැලෑව) (ලකුණු 01 යි)

(iv) Ⓓ අක්ෂරයෙන් දැක්වෙන පරිපාලන මායිම කුමක් ද?
(පළාත් / දිස්ත්‍රික්ක / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස) (ලකුණු 01 යි)

(v) Ⓟ අක්ෂරයෙන් දැක්වෙන චතුරස්‍රාකාර ප්‍රදේශය තුළ සම්මත සංකේත මගින් නිරූපණය කෙරෙන පොදු සේවා සපයන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(vi) Ⓐ - 26 මහා මාර්ගය ඔස්සේ X ස්ථානයේ සිට ගමන් ආරම්භ කරන ඔබ 73 km කණුව පසුකර උතුරු දෙසට විහිදෙන මහා මාර්ගය ඔස්සේ උතුරු මායිමේ Y ස්ථානය දක්වා ගමන් කළේ යැයි සිතන්න.

(a) ඔබ ගමන් කළ මුළු දුර ප්‍රමාණය ආසන්න වශයෙන් km කොපමණ ද? (ලකුණු 01 යි)

(b) ඔබ ගමන අවසන් කළ Y ස්ථානයේ සිට බලන විට ගමන ආරම්භ කළ X ස්ථානය පිහිටියේ කුමන දිසාවෙන් ද? (ලකුණු 01 යි)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (vii) හා (viii) ප්‍රශ්නවලින් දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා ඒවා නිවැරදි නම් '**නි**' යන්න ද වැරදි නම් '**වැ**' යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.

(vii) ප්‍රදේශයේ වී වගාව වාරි ජලය උපයෝගී කරගෙන සිදු කෙරේ. (ලකුණු 01 යි)

(viii) සමස්තයක් ලෙස ප්‍රදේශයේ දක්නට ඇත්තේ අරීය ජලවහන රටාවකි. (ලකුණු 01 යි)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක **9**) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) ඇපලාචියන් කඳුවැටිය - Ⓐ, Ⓑ, Ⓒ

(ii) ටිටිකාකා විල - Ⓓ, Ⓔ, Ⓕ

(iii) නයිජර් ගංගාව - Ⓖ, Ⓗ, Ⓘ

(iv) යුක්රේනය - Ⓙ, Ⓚ, Ⓛ

(v) බැංකොක් නගරය - Ⓜ, Ⓟ, Ⓢ (ලකුණු 05 යි)

[හයවැනි පිටුව බලන්න.

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක 9) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) උමා ඔය - Ⓐ, Ⓑ, Ⓒ

(ii) 'රිටිගල' දැඩි ස්වාභාවික රක්ෂිතය - Ⓓ, Ⓔ, Ⓕ

(iii) 'පුල්මුඩේ' ඉල්මනයිට් නිධිය - Ⓖ, Ⓗ, Ⓘ

(iv) කල්පිටිය නගරය - Ⓙ, Ⓚ, Ⓛ

(v) 'මිරිස්ස' ධීවර වරාය - Ⓡ, Ⓢ, Ⓣ (ලකුණු 05 යි)

## II කොටස

2. (i) පෘථිවි වායුගෝලයේ අඩංගු වායු වර්ග අතුරෙන්

(a) මිනිසාගේ ශ්වසනය සඳහා අවශ්‍ය වායු වර්ගය ද,

(b) ප්‍රභාසංස්ලේෂණය සඳහා අවශ්‍ය වායු වර්ගය ද

අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (a) පතන ශීඝ්‍රතාව

(b) ඕසෝන් වායුව

(c) අඩුම උෂ්ණත්වය

ඉහත දැක්වෙන වායුගෝලීය ලක්ෂණ පවත්නා වායුගෝලීය ස්තර **තුන** අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) වායුගෝලීය දූෂණය හේතුකොට ගෙන ජෛවගෝලයේ පැවැත්මට සිදුවන අහිතකර බලපෑම් **තුනක්** සඳහන් කරන්න.

(b) ජෛවගෝලයේ යහපැවැත්ම ආරක්ෂා කර ගැනීම සඳහා ඔබට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

3. (i) සාර්ථකව තේ වගා කිරීම සඳහා අවශ්‍යවන භෞතික සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය හා සම්බන්ධයෙන් උද්ගත වී ඇති ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ දියුණුවට රජය ගෙන ඇති පියවර **තුනක්** සඳහන් කර ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

4. (i) විද්‍යුත් කර්මාන්තය සඳහා ප්‍රමුඛ ස්ථානයක් ගන්නා ආසියානු කලාපයට අයත් රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) විද්‍යුත් කර්මාන්තයෙහි සුවිශේෂී ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)


(iii) (a) විද්‍යුත් උපකරණ භාවිතයෙන් සමාජයට අත්වන

(I) යහපත් ප්‍රතිඵල **දෙකක්** හා

(II) අයහපත් ප්‍රතිඵල **එකක්** ද සඳහන් කරන්න.

(b) ඔබ සඳහන් කළ **එක්** යහපත් ප්‍රතිඵලයක් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

[හත්වැනි පිටුව බලන්න.




**5.** (i) යාබදව ඇති සිතියමෙහි Ⓐ හා Ⓑ වලින් දක්වා ඇති ජාතික වනෝද්‍යාන **දෙක** පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත Ⓐ , Ⓑ හා Ⓒ යන එක් එක් කාණ්ඩය අයත් වන ප්‍රධාන වනාන්තර වර්ගය කුමක් දැයි පිළිවෙළින් නම් කරන්න.

Ⓐ - මැහෝගනී, කළුවර - කොටියා, චිම්පන්සියා

Ⓑ - යුකැලිප්ටස්, චෙස්නට් - වෘකයා, ගෝනා

Ⓒ - පොප්ලර්, පයින් - පිනිමුවා, පැන්ඩා (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව ඇති ස්වභාවික වෘක්ෂලතා වර්ගයක් වන 'කඩොලාන' පිළිබඳව පහත දැක්වෙන ශීර්ෂ යටතේ කෙටි විස්තරයක් කරන්න.

(a) ව්‍යාප්තව ඇති ප්‍රදේශ

(b) ශාකවල විශේෂ ලක්ෂණ දෙකක්

(c) ආර්ථික වටිනාකම (ලකුණු 05 යි)

**6.** (i) කිසියම් ප්‍රදේශයක ජන ඝනත්වය ගණනය කිරීම සඳහා යොදා ගන්නා සාධක **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ජන සංඛ්‍යාවේ විශාලත්වය අනුව ලෝකයේ ප්‍රමුඛ රටවල් දහය අතුරින්, චීනය සහ ඉන්දියාව හැර වෙනත් ආසියාතික රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තියෙහි අසමානතා අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර ඉන් **එකක්** පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

**7.** (i) තිරසර සංවර්ධනයේ දී අවධානය යොමු කෙරෙන ප්‍රධාන ක්ෂේත්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ මානව සම්පත් සංවර්ධනය සඳහා මෑත කාලයේ ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාදාමයේ දී යටිතල පහසුකම් සංවර්ධනය මගින් ලැබෙන ප්‍රතිලාභ **තුනක්** සඳහන් කර ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**8.** (i) නිරතුරුව ජල ගැලීම් උපද්‍රවයට භාජනය වන ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට අයත් ගංගා නිම්න **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රධාන නගර නිරන්තරයෙන් ජල ගැලීම්වලට භාජනය වීම කෙරෙහි බලපා ඇති,

(a) මානුෂ ක්‍රියාකාරකම් **දෙකක්** හා

(b) ස්වාභාවික හේතුවක් ද පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ජල ගැලීම් හේතුවෙන් නාගරික ප්‍රදේශවල සිදුවන ආපදා අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024 (2025)

විභාග අංකය / சுட்டெண் / Index Number ........................................

70289

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography II**

| පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும் For Examiner's Use Only |
|---|

1. (අ) /(அ) /(a)

(i) ..............................................................................................

(ii) ..............................................................................................

(iii) ..............................................................................................

(iv) ..............................................................................................

(v) ..............................................................................................

..............................................................................................

(vi) (a) ..............................................................................................

(b) ..............................................................................................


(vii) ..............................................................................................

(viii) ..............................................................................................

10


[නවවැනි පිටුව බලන්න/பக். 9 ஐப் பார்க்க/See page nine

(ආ) /(ஆ) /(b)




(i)
(ii)
(iii)
(iv)
(v)
5

(ඉ) /(இ) /(c)




(i)
(ii)
(iii)
(iv)
(v)
5

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும். For Examiner's Use Only.

1. (අ) (அ) (a) $\frac{}{10}$ (ආ) (ஆ) (b) $\frac{}{5}$ (ඉ) (இ) (c) $\frac{}{5}$ = $\frac{}{20}$

සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)**

# 61 - භූගෝල විද්‍යාව

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)

## 61 - භූගෝල විද්‍යාව I, II

## අවසාන ලකුණු ගණනය කිරීම

**I පත්‍රය**

ප්‍රශ්න අංක 01 - 40 (01 X 40) ලකුණු 40

**II පත්‍රය**

I කොටස

1. ප්‍රශ්නය ලකුණු 20

II කොටස

| | | |
|---|---|---|
| 2. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 3. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 4. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 5. ප්‍රශ්නය | ලකුණු 10 | ප්‍රශ්න 04කට ලකුණු 40 |
| 6. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 7. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 8. ප්‍රශ්නය | ලකුණු 10 | |

I පත්‍රයට ලකුණු 40

II පත්‍රයට ලකුණු 60

**අවසාන ලකුණු 100**

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................... √ △ $\frac{4}{5}$

(ii) ..................................................... √ △ $\frac{3}{5}$

(iii) ..................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ — එකතුව → □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.

**VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත්**

**පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

## භූගෝල විද්‍යාව I වන පත්‍රය

## ඉගෙනුම් පල

1. පෘථිවි ගෝලයේ මතුපිට ඇති භෞතික භූ දර්ශනය පැහැදිලි කරයි.
2. භෞතික භූ දර්ශනයට අයත් වන ප්‍රධාන භෞතික ලක්‍ෂණ නම් කරයි.
3. ශිලා ගෝලයේ මූලික පාෂාණ සංයුතිය පැහැදිළි කරයි.
4. පෘථිවි ජල ගෝලයේ ජලය ශිලා ගෝලය වායුගෝලය හා ජෛව ගෝලය අතර හුවමාරු වීමේ ක්‍රියාවලිය විස්තර කරයි. (ජල චක්‍රය)
5. වායුගෝලීය ස්තරවල ස්වභාවය පැහැදිලි කරයි.
6. ශ්‍රී ලංකාවේ වී වගාවට සුවිශේෂී වූ ලක්‍ෂණ පැහැදිලි කරයි.
7. ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ලක්‍ෂණ පැහැදිලි කරයි.
8. ශ්‍රී ලංකාවේ බහුලව ප්‍රයෝජනයට ගන්නා ඛනිජ සම්පත් නම් කරයි.
9. ලෝක ජන සංඛ්‍යාවේ ගති ලක්‍ෂණ සංඛ්‍යාත්මකව විස්තර කරයි.
10. මානුෂ සම්පත් සංවර්ධනයෙහි වැදගත්කම පැහැදිලි කරයි.
11. ප්‍රස්තාර කියවා ඒ ඇසුරින් තොරතුරු පැහැදිලි කරයි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 S I, II**

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

| | |
|---|---|
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| EMF | |

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## භූගෝල විද්‍යාව I

විභාග අංකය: ......................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

● අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** ප්‍රධාන වශයෙන් ......උන්නතාංශය...... සමග උෂ්ණත්වය වෙනස්වීමේ ස්වභාවය පදනම් කරගෙන වායුගෝලය ස්තර හතරකට බෙදා දැක්වේ.
(උන්නතාංශය / පීඩනය / ආර්ද්‍රතාව)

**2.** විවිධ පාෂාණ ද්‍රව්‍ය අධික තාපයට හා පීඩනයට හසුවීම නිසා ඒවායේ මුල් ස්වභාවය වෙනස්වීමෙන් ......විපරීත...... පාෂාණ නිර්මාණය වේ.
(ආග්නේය / අවසාදිත / විපරීත)

**3.** ශ්‍රී ලංකාවේ සිලිකා වැලි ඛනිජය බහුලව ව්‍යාප්ත වී ඇත්තේ ......මාරවිල...... ප්‍රදේශයෙහි ය.
(මාරවිල / පුල්මුඩේ / බිලංගොඩ)

**4.** කළුතර, කෑගල්ල හා ......රත්නපුර...... යන දිස්ත්‍රික්කවල ප්‍රධාන ව්‍යාපාරික බෝග වගාව වන්නේ රබර් ය.
(රත්නපුර / කුරුණෑගල / බදුල්ල)

**5.** ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවෙහි වැඩි ම ප්‍රතිශතයක් හිමිවන්නේ ......ග්‍රාමීය...... ජනතාවට ය.
(ග්‍රාමීය / නාගරික / වතු)

● අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් '**නි**' යන්න වටා ද වැරදි නම් '**වැ**' යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** 'හවායි' දූපත් නිර්මාණය වී ඇත්තේ යමහල් ක්‍රියාකාරිත්වයෙහි ප්‍රතිඵලයක් වශයෙනි. (නි) / වැ

**7.** 'සහරා' 'අරාබි' සහ 'ථාර්' යන කාන්තාර ප්‍රදේශ නිවර්තන දේශගුණ කලාපය තුළ පිහිටා ඇත. (නි) / වැ

**8.** මාතර, ගාල්ල සහ කළුතර යන දිස්ත්‍රික්කවල ව්‍යාප්තව ඇති තේ වගාව 'මැදරට' තේ වගාව ලෙස හැඳින්වේ. නි / (වැ)

**9.** ශ්‍රී ලංකාවේ කිරි ලබා ගැනීම සඳහා ඇතිකරනු ලබන මී ගවයන්ගෙන් 2/3 ක් ම ඇති කරනු ලබන්නේ වියළි කලාපීය ප්‍රදේශවල ය. (නි) / වැ

**10.** බෙංගාල බොක්ක අවට ඉන්දියන් සාගරයේ හටගන්නා සුළි සුළං 'හරිකේන්' නමින් හඳුන්වනු ලැබේ. නි / (වැ)

● අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්, සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** පස තුළ අන්තර්ගතව ඇති ජලය ......පාංශු ජලය...... ලෙස හැඳින්වේ.

**12.** ග්‍රැනයිට් පාෂාණවලින් සමන්විතවන මහාද්වීපික කබොල සිලිකා හා ඇළුමිනියම්වලින් යුක්තවන හෙයින් ......සියල්...... ස්තරය ලෙස හැඳින්වේ.

**13.** ඇළහැර හා ඔක්කම්පිටිය ..........මැණික්.......... ඛනිජය සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.


**14.** ලෝකයේ මහාද්වීපවල ජන සංඛ්‍යාව ව්‍යාප්ත වී ඇති ආකාරය අනුව මුළු ජන සංඛ්‍යාවෙන් 76% ක්ම වාසය කරන්නේ ආසියාව සහ ..........අප්‍රිකාව.......... යන මහාද්වීප දෙකෙහි ය.

**15.** ශ්‍රී ලංකාවේ ගෘහ කර්මාන්තවල ස්ථානගතවීම අනුව පිළිමතලාව ප්‍රදේශය වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ පිත්තල / භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයට ය.

**16.** සියලුම වනාන්තර වර්ග අතුරින් ඉහළ ම ජෛව විවිධත්වයක් දක්නට ඇත්තේ ..........නිවර්තන වර්ෂා/ තෙත්.......... වනාන්තරවල ය.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කර ගන්න.

**ශ්‍රී ලංකාවේ කිරි ආශ්‍රිත වෙළඳපොළ ප්‍රවණතා 2005-2019**




**17.** ඉහත ප්‍රස්තාරය අනුව වාර්ෂික මුළු කිරි පරිභෝජනය උපරිම අගයක් ගන්නේ ..........2018.......... වර්ෂයේ දී ය.

**18.** වාර්ෂික මුළු කිරි නිෂ්පාදන ප්‍රමාණය හා ආනයන අතර වැඩිම පරතරයක් දක්නට ඇත්තේ ..........2011.......... වර්ෂයේ දී ය.

**19.** මුළු කිරි පරිභෝජනයේ උච්චාවචනයන් කෙරෙහි වැඩි බලපෑමක් සිදුව ඇත්තේ නිෂ්පාදනය හා ආනයන අතුරෙන් කුමකින් ද? ..........ආනයන..........

- අංක **20** සිට **24** තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරු අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දක්වෙන පිළිතුරට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**20.**

| 'අ'<br>**බෝගය** | 'ආ'<br>**පර්යේෂණායතනය පිහිටා ඇති ස්ථානය** |
|---|---|
| 1. වී | A - මාතලේ |
| 2. තේ | B - ලබුකැලේ |
| 3. සුළු අපනයන බෝග | C - බෝඹුවල |
| | D - තලවාකැලේ |

(1) A, B, C (2) B, C, D (3) C, D, A (4) D, C, A (...3...)

**21.**

| 'අ'<br>**විදුලි බලාගාරය** | 'ආ'<br>**විදුලි ප්‍රභවය** |
|---|---|
| 1. කැනියොන් | A - තාප විදුලිය |
| 2. නොරොච්චෝලේ | B - සුළං බලය |
| 3. බරුතකන්ද | C - සූර්ය ශක්තිය |
| | D - ජල විදුලිය |

(1) A, B, C (2) B, C, D (3) C, B, D (4) D, A, C (...4...)

**22.**

| 'අ' සංචාරක ආකර්ෂණය | 'ආ' වැදගත් ස්ථාන |
|---|---|
| 1. දියමත ලිස්සායාම | A - ආරුගම්බේ |
| 2. සමුද්‍ර අභය භූමිය (කොරල්) | B - හික්කඩුව |
| 3. පුළුල් වැලිතලාවලට මායිම් වූ නොගැඹුරු මුහුද | C - පාසිකුඩා |
| | D - මන්නාරම |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) C, D, A (..1..)

**23.**

| 'අ' රට | 'ආ' මිලියන නගරය |
|---|---|
| 1. ඇමෙරිකා එක්සත් ජනපදය | A - සාඕ පොලෝ |
| 2. දකුණු කොරියාව | B - ලොස් ඇන්ජලීස් |
| 3. ආර්ජන්ටිනාව | C - සෝල් |
| | D - බුවනෝස් අයර්ස් |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, B, C (..2..)

**24.**

| 'අ' ගිනි කන්ද | 'ආ' පිහිටි රට |
|---|---|
| 1. ක්‍රැකටෝවා | A - ඉතාලිය |
| 2. හෙක්ලා | B - ඉන්දුනීසියාව |
| 3. පිනාටුබෝ | C - අයිස්ලන්තය |
| | D - පිලිපීන් දූපත් |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, B, C (..2..)

● අංක **25** සිට **37** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා එට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**25.** 'පැනමා' ඇළෙන් සම්බන්ධවන සාගර දෙක වන්නේ,
(1) අත්ලන්තික් සහ පැසිෆික් ය. (2) පැසිෆික් සහ ඉන්දියන් ය.
(3) ඉන්දියන් සහ අත්ලන්තික් ය. (4) පැසිෆික් සහ ආර්ක්ටික් ය. (..1..)

**26.** ප්‍රතිලෝම සම්බන්ධයක් ඇති වරණය තෝරන්න.
(1) ගෝලීය උණුසුම - හිම වැස්ම දියවීම (2) වනහරණය - කාන්තාරකරණය
(3) වර්ෂාපතනය - නායයෑම (4) උන්නතාංශය - උෂ්ණත්වය (..4..)

**27.** ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග හා සම්බන්ධ **නොගැළපෙන** පිළිතුර කුමක් ද?
(1) මල් වර්ග - නුවරඑළිය (2) කරාබු නැටි - මහනුවර
(3) කජු - මන්නාරම (4) ගම්මිරිස් - මොණරාගල (..4..)

**28.** වර්තමානයේ විශාල නෞකා බහුල වශයෙන් භාවිත වන්නේ කුමන කාර්යයක් සඳහා ද?
(1) භාණ්ඩ ප්‍රවාහනයට (2) මගී ප්‍රවාහනයට
(3) යුද කටයුතුවලට (4) ධීවර කටයුතුවලට (..1..)

**29.** ලෝහමය **නොවන** ඛනිජයකි,
(1) මැණික්. (2) ඉල්මනයිට්. (3) රූටයිල්. (4) මැග්නීසියම්. (..1..)

**30.** ශ්‍රී ලංකාවේ භූගත ජල ද්‍රෝණි බහුලව ව්‍යාප්තව ඇති දිස්ත්‍රික්ක යුගලය කුමක් ද?
(1) මන්නාරම හා මුලතිව් (2) අනුරාධපුර හා කුරුණෑගල
(3) පුත්තලම හා කිලිනොච්චි (4) ත්‍රිකුණාමලය හා වව්නියාව (..3..)

**31.** ලෝකයේ තිරිඟු නිෂ්පාදනය සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ගන්නා රටවල් දෙක ඇතුළත් වරණය තෝරන්න.
(1) චීනය හා කැනඩාව (2) ඉන්දියාව හා රුසියාව
(3) ඕස්ට්‍රේලියාව හා කැනඩාව (4) චීනය හා ඉන්දියාව (..4..)

**32.** කඳුකර වියළි කලාපීය වනාන්තර දක්නට ලැබෙන ප්‍රදේශයක් වන්නේ මින් කුමක් ද?
(1) කන්නෙලිය (2) සමනල කන්ද (3) සඳතැන්න (4) පිදුරුතලාගල (..3..)

33. මුහුදු මට්ටමේ සිට ඇති උස අනුව පෙළගැස්වූ විට නගරවල පිහිටීමේ නිවැරදි ආරෝහණ අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ත්‍රිකුණාමලය, මහනුවර, නුවරඑළිය, හැටන්
(2) ත්‍රිකුණාමලය, මහනුවර, හැටන්, නුවරඑළිය
(3) මහනුවර, හැටන්, නුවරඑළිය, නාවලපිටිය
(4) මහනුවර, නුවරඑළිය, හැටන්, ගම්පොළ (..2..)

34. පහත ප්‍රකාශ සලකන්න.
A - පරිසර දූෂණය අවම වීම
B - මූලික පිරිවැය අවම වීම
C - ක්ෂය නොවන සම්පතක් වීම
D - දේශීය තාක්ෂණය භාවිත කළ හැකිවීම
ඉහත A සිට D දක්වා ඇති කරුණු අතුරෙන් ශ්‍රී ලංකාවේ සුළං බල ශක්ති හා සූර්ය බල ශක්ති උත්පාදනය හා භාවිතය සම්බන්ධ පොදු වාසිදායක කරුණු ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.
(1) A හා B (2) A හා C (3) A හා D (4) C හා D (..2..)

35. ලෝක ජන ව්‍යාප්තිය අනුව අධික ජන සංඛ්‍යාවක් වාසය කරන ගංගා නිම්නයක් වන්නේ,
(1) කොන්ගෝ ය. (2) මරේ ඩාලිං ය.
(3) ගංගානම් ඩි. (4) ඇමේසන් ය. (..3..)

36. භූ විද්‍යාත්මක උපද්‍රවයකට නිදසුනකි,
(1) සුනාමි. (2) සුළි සුළං.
(3) අකුණු සැර. (4) ලැව් ගිනි. (..1..)

37. ශ්‍රී ලංකාවේ ආපදා අනතුරු අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි වඩාත් ප්‍රතිඵලදායී ක්‍රියාමාර්ගය වන්නේ,
(1) ජනමාධ්‍ය මගින් නිරතුරුව දැනුම්වත් කිරීම ය.
(2) ආපදා අවම කර ගැනීමේ මෙවලම් හඳුන්වා දීම ය.
(3) ආපදාවලට ඔරොත්තු දිය හැකි නූතන ඉදිකිරීම් ක්‍රම හඳුන්වා දීම ය.
(4) පාසල් අධ්‍යාපනය තුළින් ආපදා ආරක්ෂණ වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම ය. (..4..)

● පහත A, B, C සහ D මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 38 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. වන සංරක්ෂණය
2. ජල පෝෂක ප්‍රදේශ

B - 1. කාර්මීකරණය
2. පාරිසරික සමතුලිතතාව

C - 1. සංවර්ධන ක්‍රියාවලිය
2. මානව සම්පත

D - 1. ප්‍රාග්ධන හිඟය
2. බහු ජාතික සමාගම්

38. පළමුවැන්නේ සාර්ථකත්වය දෙවැන්නේ පැවැත්මට හිතකර වන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..1..)

39. දෙවැන්නේ පැවැත්මට පළමුවැන්න බාධාවක් වන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..2..)

40. පළමුවැන්නේ සාර්ථකත්වයට දෙවැන්නේ දියුණුව බලපාන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..3..)

* *

# II පත්‍රය

## 01 - ඉගෙනුම් පල :

1. 1:50000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන ප්‍රධාන භෞතික ලක්ෂණ හඳුනාගෙන නම් කරයි.
2. 1:50000 සිතියම්වල සම්මත ලකුණු හා සංකේත මගින් දක්වා ඇති සංස්කෘතික ලක්ෂණ නම් කරයි.
3. 1:50000 භූ ලක්ෂණ සිතියම්වල භෞතික හා සංස්කෘතික ලක්ෂණ අතර ඇති අන්තර් සම්බන්ධතාව පැහැදිලි කරයි.
4. ලෝකයේ හා ලංකාවේ ආකෘති සිතියම්වල ලකුණු කර දක්වා ඇති ස්ථානවල නිවැරදි පිහිටීම නම් කරයි.

## I කොටස

1\. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක 8) යොදා ගන්න.

- අංක (i) සිට (iv) තෙක් ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) Ⓐ අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?
(ඓතිහාසික ස්ථානය / ත්‍රිකෝණමිතික ස්ථානය / තානායම) (ලකුණු 01 යි)

(ii) Ⓑ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(වාරි ඇළ / අඩිපාර / රක්ෂිත මායිම) (ලකුණු 01 යි)

(iii) Ⓒ අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?
(ගල් තලාව / වනාන්තරය / ළඳු කැලෑව) (ලකුණු 01 යි)

(iv) Ⓓ අක්ෂරයෙන් දැක්වෙන පරිපාලන මායිම කුමක් ද?
(පළාත් / දිස්ත්‍රික්ක / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස) (ලකුණු 01 යි)

(v) Ⓟ අක්ෂරයෙන් දැක්වෙන චතුරස්‍රාකාර ප්‍රදේශය තුළ සම්මත සංකේත මගින් නිරූපණය කෙරෙන පොදු සේවා සපයන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(vi) Ⓐ - 26 මහා මාර්ගය ඔස්සේ X ස්ථානයේ සිට ගමන් ආරම්භ කරන ඔබ 73 km කණුව පසුකර උතුරු දෙසට විහිදෙන මහා මාර්ගය ඔස්සේ උතුරු මායිමේ Y ස්ථානය දක්වා ගමන් කළේ යැයි සිතන්න.

(a) ඔබ ගමන් කළ මුළු දුර ප්‍රමාණය ආසන්න වශයෙන් km කොපමණ ද? (ලකුණු 01 යි)

(b) ඔබ ගමන අවසන් කළ Y ස්ථානයේ සිට බලන විට ගමන ආරම්භ කළ X ස්ථානය පිහිටියේ කුමන දිසාවෙන් ද? (ලකුණු 01 යි)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (vii) හා (viii) ප්‍රශ්නවලින් දක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා ඒවා නිවැරදි නම් '**නි**' යන්න ද වැරදි නම් '**වැ**' යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.

(vii) ප්‍රදේශයේ වී වගාව වාරි ජලය උපයෝගී කරගෙන සිදු කෙරේ. (ලකුණු 01 යි)

(viii) සමස්තයක් ලෙස ප්‍රදේශයේ දක්නට ඇත්තේ අරීය ජලවහන රටාවකි. (ලකුණු 01 යි)


සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 | II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

## භූගෝල විද්‍යාව II / புவியியல் II / Geography II




SCALE : 1 : 50,000

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024 (2025)

විභාග අංකය / சுட்டெண் / Index Number ..............................

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. / பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும் / For Examiner's Use Only

1. (අ) /(அ) /(a)

(i) ත්‍රිකෝණමිතික ස්ථානය — 1

(ii) වාරි ඇළ — 1

(iii) ළඳු කැලෑව — 1

(iv) පළාත් මායිම — 1

(v) පාසල/ රෝහල — 1

(මේවායින් දෙකක් නම් කිරීම)

තානායම/ උප තැපැල් කාර්යාලය — 1

(vi) (a) 8 km — 1

(b) නිරිත දිශාව — 1

(vii) නි — 1

(viii) වැ — 1

10/10

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක 9) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.


(i) ඇපලාචියන් කඳුවැටිය - Ⓐ, Ⓑ, Ⓒ
(ii) ටිටිකාකා විල - Ⓓ, Ⓔ, Ⓕ
(iii) නයිජර් ගංගාව - Ⓖ, Ⓗ, Ⓘ
(iv) යුක්‍රේනය - Ⓙ, Ⓚ, Ⓛ
(v) බැංකොක් නගරය - Ⓜ, Ⓟ, Ⓢ (ලකුණු 05 යි)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක 9) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) උමා ඔය - Ⓐ, Ⓑ, Ⓒ
(ii) 'රිටිගල' දැඩි ස්වාභාවික රක්ෂිතය - Ⓓ, Ⓔ, Ⓕ
(iii) 'පුල්මුඩේ' ඉල්මනයිට් නිධිය - Ⓖ, Ⓗ, Ⓘ
(iv) කල්පිටිය නගරය - Ⓙ, Ⓚ, Ⓛ
(v) 'මිරිස්ස' ධීවර වරාය - Ⓡ, Ⓢ, Ⓣ (ලකුණු 05 යි)


(ආ) /(ஆ) /(b)




| | |
|---|---|
| (i) | C |
| (ii) | D |
| (iii) | G |
| (iv) | K |
| (v) | P |

5/5

(ඉ) /(இ) /(c)




| | |
|---|---|
| (i) | A |
| (ii) | F |
| (iii) | H |
| (iv) | J |
| (v) | S |

5/5

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும். For Examiner's Use Only.

1. (අ) (அ) (a) $\frac{10}{10}$ (ආ) (ஆ) (b) $\frac{5}{5}$ (ඉ) (இ) (c) $\frac{5}{5}$ = $\frac{20}{20}$

## II කොටස

### 02 - ඉගෙනුම් පල :

1. වායු ගෝලීය සංයුතිය, වායු වර්ග හා පරිමාව අනුව වර්ග කරයි.
2. වායු ගෝලයේ ව්‍යුහයේ ප්‍රධාන ස්තර 4 රූප සටහන් ඇසුරින් නම් කර දක්වයි.
3. ජෛව ගෝලය පෘථිවියේ සංයුතියේ අනෙක් කොටස් වන ශිලා ගෝලය හා වායුගෝලය සමග අන්තර් ක්‍රියාකාරිත්වයෙන් යුතු බව පෙන්වා දෙයි.

2. (i) පෘථිවි වායුගෝලයේ අඩංගු වායු වර්ග අතුරෙන්
(a) මිනිසාගේ ශ්වසනය සඳහා අවශ්‍ය වායු වර්ගය ද,
(b) ප්‍රභාසංස්ලේෂණය සඳහා අවශ්‍ය වායු වර්ගය ද
අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (a) පතන ශීඝ්‍රතාව
(b) ඕසෝන් වායුව
(c) අඩුම උෂ්ණත්වය
ඉහත දැක්වෙන වායුගෝලීය ලක්ෂණ පවත්නා වායුගෝලීය ස්තර **තුන** අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) වායුගෝලීය දූෂණය හේතුකොට ගෙන ජෛවගෝලයේ පැවැත්මට සිදුවන අහිතකර බලපෑම් **තුනක්** සඳහන් කරන්න.
(b) ජෛවගෝලයේ යහපැවැත්ම ආරක්ෂා කර ගැනීම සඳහා ඔබට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(02) i.

a) ඔක්සිජන්
b) කාබන්ඩයොක්සයිඩ්

**(ලකුණු 1 + 1 = 02)**

ii.

a) පරිවර්ති ගෝලය
b) අපරිවර්ති ගෝලය
c) මෙසෝගෝලය

**(ලකුණු 1 + 3 = 03)**

iii.

a)

- වායුගෝලය උණුසුම්වීම
- අම්ලවැසි ඇතිවීම
- ජෛව විවිධත්වය හා ජෛව නිෂ්පාදන අඩුවීම
- දේශගුණ විපර්යාස හටගැනීම

- ඇතැම් ජීවීන් වඳවීම හා නව ගහන බිහිවීම
- සත්ව ජාන විනාශවීම හා විකෘතිවීම
- වන සත්ව වාසභූමි විනාශවීම
- සත්ව අභිජනනීය කලාප වෙනස්වීම
- බෝග විනාශවීම හා අස්වැන්න අඩුවීම
- වනාන්තර විනාශවීම
- විවිධ වසංගත රෝග හටගැනීම
- සමුද්‍ර සම්පත් විනාශවීම

**මෙවැනි අහිතකර බලපෑම් තුනක් සඳහන් කිරීම ලකුණු 3**

b)

- විධිමත්ව කසල බැහැර කිරීම
- විකල්ප බලශක්ති ක්‍රම භාවිතයට හුරුවීම
- වන විනාශය වැලැක්වීම සඳහා රුක් රෝපණයට සහායවීම
- රසායනික පොහොර වෙනුවට ඓන්ද්‍රීය පොහොර භාවිතය
- ජනතාව දැනුම්වත් කිරීමේ ක්‍රම අනුගමනය කිරීම (පෝස්ටර්)
- පොදු ප්‍රවාහන සේවා භාවිතය
- පරිසර හිතකාමී ජීවන පුරුදුවලට හුරුවීම
- සරළ දිවි පැවැත්ම

**මෙවැනි කරුණු දෙකක් පැහැදිලි කිරීම ලකුණු 2**

**(ලකුණු (a) 3 + (b) 2=05)**

**03 - ඉගෙනුම් පල :**

1. තේ වගාවේ මූලික ලක්ෂණ පැහැදිලි කරයි.
2. ප්‍රධාන කෘෂිබෝග ආශ්‍රිත ගැටලු විස්තර කරයි.
3. ප්‍රධාන කෘෂිබෝග ආශ්‍රිත ප්‍රවණතා පැහැදිලි කරයි.

**3.** (i) සාර්ථකව තේ වගා කිරීම සඳහා අවශ්‍යවන භෞතික සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය හා සම්බන්ධයෙන් උද්ගත වී ඇති ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ දියුණුවට රජය ගෙන ඇති පියවර **තුනක්** සඳහන් කර ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(03) i.

- $1900^{mm}$ - $5400^{mm}$ අතර වර්ෂාපතනය (වාර්ෂික)
- $15\,^0C$ - $27^0C$ දක්වා සාමාන්‍ය උෂ්ණත්වය
- ලෝම් ලැටරයිට් පස
- ජලය බැස යන මඳ බෑවුම් සහිත ප්‍රදේශ

**(මෙවැනි සාධක 2ක් දැක්වීම ලකුණු 1 + 1 = 02)**

ii. ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ ගැටලු

- ඉඩම් කැබලිවීම
- එකම බිමක දීර්ඝකාලීනව වගාකිරීම නිසා අස්වැන්න අඩුවීම
- වගාව පැරණිවීම නිසා අස්වැන්න අඩුවීම
- බිම් ඒකකයකින් ලබා ගන්නා අස්වැන්න අඩුවීම
- පොහොර මිල ඉහළ යාම
- කර්මාන්ත ශාලා නවීකරණය නොවීම
- කම්කරු ගැටලු හා වෘත්තීය සමිති ගැටලු
- වගා සහනාධාර වැඩපිළිවෙල ක්‍රමවත් නොවීම
- ආදේශක පාන වර්ගවලින් එල්ල වන තරගය ආදේශක බීම වර්ග
- වෙනත් රටවලින් එල්ල වන තරගය - (කෙන්යාව/ ටැන්සානියාව වැනි)
- ගුණාත්මක බවින් අඩු නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපලට යැවීම

**(මෙවැනි ගැටලු තුනක් සඳහන් කිරීම ලකුණු 1 +3 = 03)**

iii. තේ කර්මාන්තයේ දියුණුවට රජය ගෙන ඇති පියවර

- නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා සහනාධාර දීම
- අපනයන තීරුබදු සහන ලබාදීම
- වෙළඳපොල සේවා පුළුල් කිරීම
- පොහොර සහනාධාර සැපයීම
- රක්ෂණ ක්‍රම
- නැවත වගා කිරීම සඳහා සහනාධාර ලබාදීම
- තලවකැලේ තේ පර්යේෂණායතනය } මගින් ඉටු කරන සේවා
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය }
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය
- නිෂ්පාදන විවිධාංගකරණය දිරිමත් කිරීම
- තත්වයෙන් බාල තේ අපනයන වැළැක්වීමට නීති ක්‍රියාත්මක කිරීම
- කාබනික තේ වගාව දිරිමත් කිරීම

**මෙවැනි පියවර තුනක් නම් කර එකක් විස්තර කිරීම**

**පියවර තුන නම් කිරීමට ලකුණු** = 03

**එක් පියවරක් විස්තර කිරීමට ලකුණු** = 02

05

## 04 - ඉගෙනුම් පල :

1. නිෂ්පාදන කර්මාන්තවල ව්‍යාප්තිය ලෝක සිතියමක් ඇසුරින් නම් කරයි.
2. නිෂ්පාදන කර්මාන්තවල ලක්ෂණ පැහැදිලි කරයි.
3. නිෂ්පාදන කර්මාන්තවල ප්‍රවණතා පැහැදිලි කරයි.
4. නිෂ්පාදන කර්මාන්ත හා සම්බන්ධ පොදු ගැටලු සාකච්ඡා කරයි.

**4.** (i) විද්‍යුත් කර්මාන්තය සඳහා ප්‍රමුඛ ස්ථානයක් ගන්නා ආසියානු කලාපයට අයත් රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) විද්‍යුත් කර්මාන්තයෙහි සුවිශේෂී ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) විද්‍යුත් උපකරණ භාවිතයෙන් සමාජයට අත්වන

(I) යහපත් ප්‍රතිඵල **දෙකක්** හා

(II) අයහපත් ප්‍රතිඵල **එකක්** ද සඳහන් කරන්න.

(b) ඔබ සඳහන් කළ **එක්** යහපත් ප්‍රතිඵලයක් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

04) i. විද්‍යුත් කර්මාන්තයට ප්‍රමුඛ ආසියානු රටවල් දෙකක්

- චීනය
- ජපානය
- දකුණු කොරියාව
- ඉන්දියාව
- මැලේසියාව
- තායිවානය
- තායිලන්තය
- වියට්නාමය

**(මේවායින් රටවල් දෙකක් නම් කිරීමට ලකුණු 1 + 1 = 02)**

ii. විද්‍යුත් කර්මාන්තයේ සුවිශේෂ ලක්ෂණ තුනක් සඳහන් කිරීම

- විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කිරීම
- අවසන් නිමැවුම දක්වාම නිරන්තරයෙන් පර්යේෂණ සිදු කිරීම හා නිෂ්පාදනයට වැය කරන මුදල මෙන් දෙගුණයක් පර්යේෂණ සඳහා වැය කිරීම
- ශ්‍රමිකයන්ගෙන් විශාල පිරිසක් විද්‍යාඥයන්, ඉංජිනේරුවන්, පර්යේෂකයන් හා පුහුණු කාර්මික ශිල්පීන් වීම
- නිෂ්පාදන අයිතිය හා දායකත්වය බොහෝවිට බහුජාතික සමාගම් සතුවීම
- වෙළඳපොල තරඟකාරිත්වයට ගැලපෙන පරිදි දිනෙන් දින නව නිෂ්පාදන එළි දැක්වීම
- ඉතාමත් සංකීර්ණ සූක්ෂම භාණ්ඩ හා උපාංග නිෂ්පාදනය
- නිපදවා ආනයනය කරන රටවල් විසින්ම වෙනත් රටවලින් විද්‍යුත් උපකරණ ආනයනය කිරීම
- එකලස් කිරීමේ කර්මාන්තයක් වීම

- අතුරු නිෂ්පාදන සඳහා වෙළඳපොලක් බිහිවීම
- නිෂ්පාදනය සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිතය (AI)

**මෙවැනි ලක්ෂණ තුනක් සඳහන් කිරීමට ලකුණු 1 x 3 = 03**

iii.

(a) I විද්‍යුත් උපකරණ භාවිතයෙන් සමාජයට අත්වන යහපත් ප්‍රතිඵල

- එදිනෙදා කටයුතු පහසුවෙන්, ඉක්මනින් හා කාර්යක්ෂමව ඉටුකර ගැනීමේ හැකියාව ඇතිවීම
- අධ්‍යාපනය
- සන්නිවේදනය
- සෞඛ්‍යය
- වෙළඳාම
- බැංකු කටයුතු (මූල්‍ය) වැනි ක්ෂේත්‍රවල කටයුතු කාර්යක්ෂම හා පහසුවීම
- කාලය ඉතිරිවීම

**මෙවැනි යහපත් ප්‍රතිඵල දෙකක් සඳහන් කිරීමට ලකුණු 02**

II අයහපත් ප්‍රතිඵල

- යන්ත්‍රවලට වහල්වීම
- හුදෙකලා බව
- සමාජ සම්බන්ධතා ගිලිහීයාම
- සෞඛ්‍ය ගැටලු
- ආත්මාර්ථය
- විවිධ අනතුරු
- සියදිවි නසාගැනීම් වැඩිවීම
- විවිධ අපචාර ක්‍රියා බහුලවීම
- ඇබ්බැහිවීම්
- මූල්‍ය වංචා සිදුවීම

**මෙවැනි අයහපත් ප්‍රතිඵල එකක් සඳහන් කිරීමට ලකුණු 01**

**(ලකුණු (a) (I) 2 + (II) 1=03)**

(b) යහපත් ප්‍රතිපළයක් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ඉවහල් වන ආකාරය පැහැදිලි කිරීමට ලකුණු 02

**(ලකුණු (a) 03 + (b) 2=05)**

**05 - ඉගෙනුම් පල :**

1. ශ්‍රී ලංකාවේ වනාන්තරවල ව්‍යාප්තිය හා ලක්ෂණ විස්තර කරයි.
2. ශ්‍රී ලංකාවේ වනජීවී රක්ෂිත ප්‍රදේශ වර්ග නම් කර ඒවායේ වැදගත්කම පැහැදිලි කරයි.
3. ශ්‍රී ලංකාවේ වනජීවී රක්ෂිත ප්‍රදේශවල ව්‍යාප්තිය සිතියමක් ඇසුරින් නම් කරයි.
4. ලෝකයේ වනාන්තරවල ලක්ෂණ පැහැදිලි කරයි.

**5.** (i) යාබදව ඇති සිතියමෙහි Ⓐ හා Ⓑ වලින් දක්වා ඇති ජාතික වනෝද්‍යාන **දෙක** පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත Ⓐ , Ⓑ හා Ⓒ යන එක් එක් කාණ්ඩය අයත් වන ප්‍රධාන වනාන්තර වර්ගය කුමක් දැයි පිළිවෙළින් නම් කරන්න.

Ⓐ - මැහෝගනි, කළුවර - කොටියා, චිම්පන්සියා

Ⓑ - යුකැලිප්ටස්, චෙස්නට් - වෘකයා, ගෝනා


Ⓒ - පොප්ලර්, පයින් - පිනිමුවා, පැන්ඩා (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව ඇති ස්වභාවික වෘක්ෂලතා වර්ගයක් වන 'කඩොලාන' පිළිබඳව පහත දැක්වෙන ශීර්ෂ යටතේ කෙටි විස්තරයක් කරන්න.

(a) ව්‍යාප්තව ඇති ප්‍රදේශ

(b) ශාකවල විශේෂ ලක්ෂණ දෙකක්

(c) ආර්ථික වටිනාකම (ලකුණු 05 යි)




I.

A - විල්පත්තු

B -යාල

**ලකුණු 1 + 1=02**

II.

A – නිවර්තන වර්ෂා

B – සෞම්‍ය කලාපීය

C – කේතුධර

**ලකුණු 1 x 3=03**

**III.** ශ්‍රී ලංකාවේ කඩොලාන වෘක්ෂලතා

a) ව්‍යාප්ත ප්‍රදේශ

- ශ්‍රී ලංකාවේ වෙරළ වටා ඇති ගංගා මෝය කළපු වැනි ජලාශ්‍රිත ප්‍රදේශ ආශ්‍රිතව - **ලකුණු 01**

b) ශාකවල විශේෂ ලක්ෂණ

- මුල් බහුලවීම (කරු මුල්/ කයිරු මුල්/ වායුධර මුල්)
- මුල් ජලයෙන් ඉහළට විහිදීම
- ජලයේ ලවණතාව ඉසිලිය හැකි වීම
- ඇතැම් විශේෂවල බීජ මව් ශාකයට සවිවී තිබියදීම ප්‍රරෝහණය වී ගසෙන් ජලයට වැටුන පසු පසට සවි වී පැලවේ.
- ශාක පත්‍ර ඝන ස්වභාවයකින් යුතු වේ.

**ලකුණු 02**

c) ආර්ථික ප්‍රයෝජන

- කිවුල් දිය ධීවර කර්මාන්තයට වැදගත් වේ.
- විසිතුරු මත්ස්‍ය කර්මාන්තයට වැදගත් වේ.
- වෙරළ ඛාදනය වළකාලයි.
- බොහෝ ජලජ සතුන්ට අභිජනන ස්ථාන වේ. (ඉස්සන්, කකුළුවන්)
- සංචාරක ආකර්ෂණයක්වීම
- ඉන්ධන සඳහා දර සපයන මාධ්‍යයක්වීම හා ලී දඬු සැපයීම
- බීම වර්ග නිෂ්පාදනයට දායක වේ. (කිරල ගෙඩි)
- කාර්මික අමු ද්‍රව්‍යයක්වීම (කිරල මූඩි)

**ලකුණු** 02

**(ලකුණු (a) 1 + (b) 2 + (c) 2 =05)**

**06 - ඉගෙනුම් පල :**

1. ලෝක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ සංඛ්‍යාත්මකව විස්තර කරයි.
2. ලෝක ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය සඳහා බලපාන සාධක පැහැදිලි කරයි.
3. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ විශේෂිත ලක්ෂණ නිදසුන් ඇසුරින් පැහැදිලි කරයි.

**6.** (i) කිසියම් ප්‍රදේශයක ජන ඝනත්වය ගණනය කිරීම සඳහා යොදා ගන්නා සාධක **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ජන සංඛ්‍යාවේ විශාලත්වය අනුව ලෝකයේ ප්‍රමුඛ රටවල් දහය අතුරින්, චීනය සහ ඉන්දියාව හැර වෙනත් ආසියාතික රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තියෙහි අසමානතා අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර ඉන් **එකක්** පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

I.

- ජන සංඛ්‍යාව
- බිම් ප්‍රමාණය
- ජන ඝණත්වය $= \frac{\text{ජන සංඛ්‍යාව}}{\text{බිම් ප්‍රමාණය}}$

**ලකුණු 1 + 1=02**

II.

- ඉන්දුනීසියාව
- පකිස්ථානය
- බංග්ලාදේශය
- ජපානය

**මින් තුනක් නම් කිරීමට ලකුණු 1 x 3=03**

III.

- ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් ග්‍රාමීය ප්‍රදේශවලින් නාගරික ප්‍රදේශවලට සිදුවන ජන සංක්‍රමණය අවම කිරීම - (එම ප්‍රදේශවල අධ්‍යාපන, සෞඛ්‍ය, විදුලිය, කර්මාන්ත, ප්‍රවාහන කටයුතු දියුණු කිරීම)
- ග්‍රාමීය ප්‍රදේශවල රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම
- ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම
- තෙත් කලාපයේ ජන පීඩනය අවම කිරීම සඳහා වියළි කලාපීය ප්‍රදේශ සංවර්ධනය මගින් එම ප්‍රදේශවල ජනාවාස බිහි කිරීම

**මෙවැනි ක්‍රියා මාර්ග තුනක් නම් කිරීමට ලකුණු - 03**
**එක් ක්‍රියා මාර්ගයක් විස්තර කිරීමට - 02**
**05**

**07 - ඉගෙනුම් පල :**

1. සංවර්ධන ක්‍රියාවලියේදී තිරසාර සංවර්ධනයක අවශ්‍යතාව පැහැදිලි කරයි.
2. ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාදාමයේදී ජාතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
3. මානුෂ සම්පත් සංවර්ධනයෙහි වැදගත්කම පැහැදිලි කරයි.

**7.** (i) තිරසර සංවර්ධනයේ දී අවධානය යොමු කෙරෙන ප්‍රධාන ක්ෂේත්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ මානව සම්පත් සංවර්ධනය සඳහා මෑත කාලයේ ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාදාමයේ දී යටිතල පහසුකම් සංවර්ධනය මගින් ලැබෙන ප්‍රතිලාභ **තුනක්** සඳහන් කර ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

I. තිරසර සංවර්ධනයේදී අවධානය යොමු කරන ප්‍රධාන ක්ෂේත්‍ර 2 ක් නම් කිරීම

- ආර්ථික
- සමාජීය
- පාරිසරික

**මින් දෙකක් නම් කිරීමට ලකුණු 1 + 1=02**

II. ශ්‍රී ලංකාව මානව සම්පත් සංවර්ධනය සඳහා මෑත කාලයේ ගෙන ඇති ක්‍රියා මාර්ග

- ජන සවිය
- අස්වැසුම
- සමෘද්ධි
- ගැමි දිරිය
- දිවි නැගුම
- නව නිවාස සංකීර්ණ
- වෘත්තීය තාක්ෂණික ප්‍රමිතීන් හඳුන්වාදීම (NVQ Level)
- පරිගණක සාක්ෂරතා පාඨමාලා හඳුන්වා දීම
- පෞද්ගලික අංශය මගින් වැඩි දායකත්වයක් ලබාදීම

- 13 වසරක අඛණ්ඩ වෘත්තීය අධ්‍යාපනය හඳුන්වා දීම
- ප්‍රජා මූල සෞඛ්‍ය වැඩසටහන්
- ප්‍රජා මූලික ජල ව්‍යාපෘති
- මග නැගුම
- ග්‍රාමීය විදුලි ව්‍යාපෘති
- පාසල් හැරයන්නන් සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
- විශ්ව විද්‍යාල ප්‍රමාණය හා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම
- උසස් පෙළ සඳහා තාක්ෂණික විෂය හඳුන්වාදීම

**මෙවැනි ක්‍රියාමාර්ග තුනක් නම් කිරීමට ලකුණු 1 x 3=03**

III. ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියේදී යටිතල පහසුකම් සංවර්ධනය මගින් ලැබෙන ප්‍රතිලාභ තුනක් සඳහන් කර එකක් විස්තර කිරීම

- රටේ නව ප්‍රදේශ සංවර්ධනයට විවෘත වේ.
- වෙළඳපොල පුළුල් වේ.
- මගී භාණ්ඩ සංචලනය වේගවත් වේ.
- භෞතික දුර අඩුවීම මගින් කාලය ඉතිරි වේ.
- අභ්‍යන්තර සංක්‍රමණ රටාව වෙනස් වේ.
- නව රැකියා අවස්ථා
- භාණ්ඩ හා සේවා සැපයුම් මාර්ග ජාලයෙහි වෙනසක් ඇති වේ. (මෝටර් රථ, ගුවන්, වරාය)

**මින් එකක් පිළිබඳ විස්තර කිරීම**
**ප්‍රතිලාභ තුනක් නම් කිරීමට ලකුණු - 03**
**එකක් පැහැදිලි කිරීම ලකුණු - 02**
**05**

## 08 - ඉගෙනුම් පල :

1. ස්වාභාවික ආපදා ඇතිවන හා හානිවන ප්‍රදේශ ශ්‍රී ලංකාවේ සිතියමක් ඇසුරින් විස්තර කරයි.
2. ආපදාවලින් සිදුවන හානි හා ආපදා කළමනාකරණයට ගතහැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.

**8.** (i) නිරතුරුව ජල ගැලීම් උපද්‍රවයට භාජනය වන ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට අයත් ගංගා නිම්න **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රධාන නගර නිරන්තරයෙන් ජල ගැලීම්වලට භාජනය වීම කෙරෙහි බලපා ඇති,

(a) මානුෂ ක්‍රියාකාරකම් **දෙකක්** හා

(b) ස්වාභාවික හේතුවක් ද පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ජල ගැලීම් හේතුවෙන් නාගරික ප්‍රදේශවල සිදුවන ආපදා අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

I.

- කැළණි
- කළු
- ගිං
- නිල්වලා
- අත්තනගලු ඔය

**ගංගා දෙකක් නම් කිරීමට ලකුණු 1 + 1=02**

II. මෑතදී ලංකාවේ ප්‍රධාන නගර නිරතුරුව ජලගැලීම් උපද්‍රවයට භාජනය වීමට බලපෑ

a) මානුෂ ක්‍රියාකාරකම්

- ජලමාර්ග අවහිර වන සේ කරන ලද අනවසර ඉදිකිරීම්
- ජලය බැසයන කානු පද්ධති අවහිරවීම/ සකස් නොකිරීම
- කැලිකසල අවිධිමත් ලෙස බැහැර කිරීම
- අවිධිමත් ලෙස පහත් බිම් ගොඩ කිරීම

b) ස්වාභාවික හේතු

- කෙටි කාලයක් තුල අධික වර්ෂාපතනය
- ගංගා ජලාශ හා වැව් පිටාර ගැලීම
- ගං මෝය ස්වාභාවිකව අවහිරවීම

**ස්වභාවික හේතු එකකට ලකුණු - 01**

**(ලකුණු (a) 2 + (b) 1 =03)**

c) ජල ගැලීම් මගින් නාගරික ප්‍රදේශවලට සිදුවන ආපදා අවම කර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් නම්ක ර එකක් විස්තර කිරීම

- අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම
- ජලය බැස යන කානු පද්ධති අවහිරවීම වැළැක්වීම
- කසල බැහැර කිරීම විධිමත් කිරීම
- පහත් බිම් ගොඩ කිරීම වැළැක්වීමට නීති පැනවීම හා ක්‍රියාත්මක කිරීම
- ජලයෙන් යටවන ප්‍රදේශවල ජනතාව උස්බිම් ප්‍රදේශවල පදිංචි කරවීම
- ජලය එක් රැස්විය හැකි ස්ථානවල ජලාශ ඉදිකර වැසි ජලය ගලා යාමට සැලැස්වීම (සුදුසු ස්ථානවල)
- මාර්ග වඩා උස්ව නිර්මාණය කිරීම
- ජල ගැලීම්, ආපදාවලට ඔරොත්තු දෙන පරිදි ඉදිකිරීම් සිදු කිරීම
- පිටාර ගැලීම් සිදුවන ස්ථානවල මානව කටයුතු සීමා කිරීම
- දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**ක්‍රියාමාර්ග තුනක් නම් කිරීමට ලකුණු - 03**
**එක් ක්‍රියාමාර්ගයක් විස්තර කිරීමට ලකුණු - 02**
**05**